රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 06/2014 (II)

මගේ අංකය : EST/8/ALLOW/03/121 vol.06
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2015.06.03

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>ව්‍යාප්ති කටයුතුවල නිරත ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා දීමනා</u>

2014.03.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2014 හා 2014.06.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2014 (I) හි විධිවිධාන කෙරෙහි ඔබේ අවධානය යොමු කරවන අතර එම චක්‍රලේඛයන් හි ඇමුණුම් I හා IIහි සඳහන් තනතුරුවලට අමතරව මෙම චක්‍රලේඛයේ ඇමුණුම I හා IIහි සඳහන් නිලධාරින්ට ද 2014 ජනවාරි මස සිට මාසිකව රු.300/-ක දීමනාවක් ගෙවීම අනුමත කරමි.

02. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය

**ඇමුණුම I**

**මධ්‍යම රජයේ සේවක සංඛ්‍යා තනතුරු - ක්ෂේත්‍ර නිලධාරී**

| අනු අංකය | තනතුර |
|---|---|
| 1. | ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර<br>(ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරන ලද) |
| 2. | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී |
| 3. | ප්‍රජා සෞඛ්‍ය  සංවර්ධන නිලධාරී<br>(ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය) |
| 4. | උපදේශන නිලධාරී<br>ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය -<br>(ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරන ලද) |
| 5. | සංවර්ධන නිලධාරී (සමෘ)/ වැඩසටහන් සහකාර (සමෘ) |
| 6. | දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී |
| 7. | කීට විද්‍යා සහකාර (සෞඛ්‍ය අමාත්‍යාංශය) |
| 8. | ව්‍යාප්ති නිලධාරී (ආයුර්වේද දෙපාර්තමේන්තුව) |
| 9. | සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී |
| 10. | කර්මාන්ත පරීක්ෂක |
| 11. | විමර්ශන සහකාර (ඉඩම් අත්පත්) |
| 12. | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී (සෞඛ්‍ය අමාත්‍යාංශය) |
| 13. | වැඩසටහන් නිලධාරී (ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව) |
| 14. | මනෝ වෛද්‍ය සමාජ සේවක |
| 15. | මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී<br>(සෞඛ්‍ය අමාත්‍යාංශය – මැලේරියා මර්ධන වැඩසටහන) |
| 16. | මහජන සෞඛ්‍ය පරීක්ෂක (සෞඛ්‍ය අමාත්‍යාංශය) |
| 17. | ක්‍රීඩා පුහුණුකරු |
| 18. | ක්‍රීඩා නිලධාරී (ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව) |
| 19. | වන අධිවි ආරක්ෂක |
| 20. | වන අධිවි ආරක්ෂක සහකාර |
| 21. | කාන්තා සංවර්ධන නිලධාරී<br>(ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරන ලද) |
| 22. | සංවර්ධන සහකාර<br>(දේශීය ණය හා සංවර්ධන අරමුදල) |
| 23. | සංඛ්‍යාලේඛන සහකාර |
| 24. | සංවර්ධන සම්බන්ධීකාරක |

**<u>ඇමුණුම II</u>**

**<u>පළාත් සහා සේවක සංඛ්‍යා තනතුරු - ක්ෂේත්‍ර නිලධාරී</u>**

| අනු අංකය | තනතුර |
|---|---|
| 1. | සැලසුම් ශිල්පී (ශ්‍රී ලංකා තාක්ෂණ සේවය) සියළුම පළාත් සභා |
| 2. | කීට විද්‍යා සහකාර (සෞඛ්‍ය අමාත්‍යාංශය) සියළුම පළාත් සභා |

* පහත නිර්වචනයට අයත්වන නිලධාරීන් පමණක් මෙම දීමනාව සඳහා හිමිකම් ලබයි.

"ක්ෂේත්‍ර නිලධාරියා" යන්නෙන් ප්‍රධාන වශයෙන්ම බිම් මට්ටමේ ව්‍යාප්ති සේවා කටයුතු පැවරී ඇති, එක් විශේෂ ස්ථානයකට සීමා නොවන, ක්ෂේත්‍රයට නිතිපතා යා යුතු, පරීක්ෂණ හා චාරිකා සිදු කිරීම අවශ්‍ය වන්නා වූ, රාජකාරි ස්වභාවය අනුවම ක්ෂේත්‍ර රාජකාරිවලට සම්බන්ධ වන හා තම වගකීම් එක් නිශ්චිත සේවා ස්ථානයකට හෝ කාර්යාලයකට සීමා නොවන නිලධාරියෙක් අදහස් කෙරේ.